# පිළිසඳර
# PILISANDARA

2017
ජනවාරි/පෙබරවාරි
npassrilanka@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of the National Photographic Art Scoiety of Sri Lanka


## 2017
## සුබ නව වසරකට ආසිරි

**උදාවූ 2017 නව වසර ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ සියලු සාමාජික භවතුන්ගේ බලාපොරොත්තු ඉටුවන වාසනාවන්ත සුබ ම සුබ නව වසරක් වේවා!!**

### නව වසරේ පංති ආරම්භය

2017 වසරේ ඡායාරූප ශිල්ප පංති ආරම්භය ජනවාරි 29 දින උත්සවාකාරයෙන් සිදුකරලීමට විධිවිධාන යොදා ඇත. එදින ප.ව 1.00 ට කොළඹ මහවැලි කේන්ද්‍රයේ දී පළමු සැසිය පැවැත්වෙන අතර ඊළඟ සතියේ පටන් සුපුරුදු පරිදි මහබෝධි විද්‍යාලයේ දී ඉරුදින ඡායාරූප පාඨමාලා පැවැත්වේ.

### ජනවාරි 22 ඉරිදාව වෙන්කර තබා ගන්න

**සංගමයේ අර්ධ වාර්ෂික මහා සභාව ජනවාරි 22 වැනි දින පෙරවරු 9.00 ට කොළඹ, ආනන්ද කුමාරස්වාමි මාවතේ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට සැලසුම් කොට ඇත. එදිනට ඔබගේ පැමිණීම අත්‍යවශ්‍ය ම වේ.**

**අදාළ නිල දැන්වීම හා ආරාධනය සඳහා පිළිසඳර ඇතුළු පිටු බලන්න.**

### ඩිප්ලෝමා ප්‍රදානෝත්සවයට සියල්ල සූදානම්..

66 වසරක සාඩම්බර ඉතිහාසයක් හිමි ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 2014/15 වර්ෂයන්හි තුන් අවුරුදු ඩිප්ලෝමාව සාර්ථකව නිම කර සහතිකපත් ලබන 52 වැනි හා 53 වැනි කණ්ඩායම් වල ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය. ජනවාරි 20 වන සිකුරාදා දින පෙරවරු 09.00ට, කොළඹ 07, ජාතික කෞතුකාගාර ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු සූදානම් වෙමින් පවතී. ඒ සඳහා සාමාජික ඔබ සැමට විවෘතව ආරාධනය කරමු.

### ඉදිරි වසරේ අපේ පෙළගැස්ම..

| | | |
|---|---|---|
| ජනවාරි | 08- | හෑගොඩ සූරීන් අනුස්මරණ පිංකම නවකයින් බඳවාගැනීමේ සම්මුඛ පරීක්ෂණ |
| | 15- | වාර්ෂික ඡායාරූප ශිල්ප පරීක්ෂණය |
| | 20- | ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය |
| | 22- | අර්ධ වාර්ෂික මහා සභාව |
| | 29- | ඡායාරූප පාඨමාලා සමාරම්භක උත්සවය. |
| පෙබ. | 19- | '03 වන ඉරිදා' වැඩසටහන |
| මාර්තු | 12- | මෘදු කුසලතා වැඩමුළුව |
| | 19- | '03 වන ඉරිදා' වැඩසටහන |
| අප්‍රේල් | 22- | අලුත් අවුරුදු සාමාජික සුහද හමුව |


**QD/149/NEWS/2017**



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

# නිල ආරාධනා පත්‍රය

## අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම - 2016/2017

හිතවත් සාමාජික / සාමාජිකාවන් වෙත,

අප සංගමයේ 2016/2017 වර්ෂයේ අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම පහත සඳහන් දින පැවැත්වීමට තීරණය කර ඇත.

| | | |
|---|---|---|
| දිනය | : | 2017 ජනවාරි මස 22 වැනි ඉරු දින |
| වේලාව | : | පෙරවරු 09.00 ට |
| ස්ථානය | : | කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ<br>මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී |

මෙදින රැස්වීමට ඔබගේ පැමිණීම අප ගෞරවයෙන් යුතුව අපේක්ෂා කරමු.

*ගරු අධ්‍යක්ෂ මණ්ඩලය*

## අර්ධ වාර්ෂික මහා සභා රැස්වීම - 2016/17
## න්‍යාය පත්‍රය

- විරාගත පොල් තෙල් පහන දැල්වීම
- ජාතික ගීය වාදනය කිරීම
- සභාව පිළිගැනීම - සභාපති
- අප අතරින් වියෝවී ඇති සාමාජික/ සාමාජිකාවන් සිහිකිරීම
- ලිපි කියවීම
- 2015/16 වාර්ෂික මහා සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත්කිරීම - විධායක අධ්‍යක්ෂ
- එම රැස්වීම් වාර්තාව සභා සම්මත කරගැනීම
- ප්‍රගති සමාලෝචනය ඉදිරිපත් කිරීම - විධායක අධ්‍යක්ෂ
- අයවැය සමාලෝචනය ඉදිරිපත් කිරීම - මුදල් අධ්‍යක්ෂ
- අදහස් හා යෝජනා
- ස්තුති කථාව - විධායක අධ්‍යක්ෂ

**මතකනේ.. ජනවාරි 22 ඉරිදාවේ.. උදේ 09 ට.. මහවැලියට..**



# පිළිසඳර විද්‍යුත් තැපෑලෙන්..

මුද්‍රණ හා තැපැල් වියදම්වල ඉහළ යාමත්, බොහෝ සාමාජික භවතුන් අන්තර්ජාල සංනිවේදන කාර්යයන් සඳහා වැඩි ලැදියාවක් දැක්වීමත් හේතුවෙන් ඔබේ අවශ්‍යතාව මත පමණක් ඉදිරියෙ දී පිළිසඳර මුද්‍රිත ප්‍රකාශයක් ලෙස නිකුත් කිරීමට ගරු අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කොට ඇත. එබැවින් ඉදිරි පිළිසඳර සංගමයේ වෙබ් අඩවියෙන් (www.npaslanka.org) වෙතින් හෝ පිළිසඳර ෆේස්බුක් පිටුව මගින් මෙන් ම සංගමයේ නිල ෆේස්බුක් සමූහය වන 'අපි NPAS' සමූහය තුළින් ද ලබා ගත හැකිය. එසේ වුවද ඔබ විසින් ඉදිරයට ද පිළිසඳර මුද්‍රිත ප්‍රකාශය පුරුදු ලෙස ම තැපැල් මගින් ගෙන්වාගැනීමට අවශ්‍ය නම් ඊට ද කිසිදු බාධාවක් නොමැත. එබැවින් ඉදිරි කලාපයේ පටන් පිළිසඳර මුද්‍රිත ප්‍රකාශනය අවශ්‍ය අය පහත සඳහන් කූපනය හෝ එහි ඡායා පිටපතක් පුරවා පුරවා ගරු ප්‍රකාශන අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, අංක 170, කොලොන්නාව පාර, දෙමටගොඩ, කොළඹ 09 යන ලිපිනයට යොමු කරන්න. ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනයට පෞද්ගලිකව පිළිසඳර මුදු පිටපතක් ලබා ගත යුතු නම් ඒ බව ප්‍රකාශන අධ්‍යක්ෂ මනුජිත් කටුගම්පොළ මහතාට (0766 450 693) දුරකථනයෙන් දැනුම් දී ඔබගේ විද්‍යුත් තැපැල් ලිපිනය සහ නම SMS කරන්න.

**පිළිසඳර මුද්‍රිත ප්‍රකාශනය ලබාගැනීම**

**2017 වසරේ පටන් පිළිසඳර ද්වි මාසික සංග්‍රහයේ මුද්‍රිත කලාප මා වෙත තැපැල් මගින් එවන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.**

**නම** : ..........................................................................
**සාමාජික අංකය** : ..........................................................................
**දුරකථන අංකය** : ..........................................................................
**ලිපිනය** : ..........................................................................
..........................................................................

.....................
**දිනය**

.......................
**අත්සන**

## අධ්‍යාපන පුවත්

# පාසැල් ඡායාරූප ශිල්ප පරීක්ෂණය - 2016






ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය මගින් පාසැල් දරුවන් සඳහා වාර්ෂිකව පවත්වන ඡායාරූප ශිල්ප පරීක්ෂණය පසුගිය දෙසැම්බර් මස 03 වැනි සෙනසුරාදා කොළඹ නාලන්දා විද්‍යාලයේ දී පැවැත්විණි. ඒ සඳහා ලියාපදිංචි අපේක්ෂකයින් 80 දෙනෙකුගෙන් එදින විභාගය සඳහා 65 දෙනෙක් පෙනී සිටියහ.

ඒ සඳහා ලංකාවේ ප්‍රධාන පෙළේ පාසල් වන කොළඹ ආනන්ද විද්‍යාලය, කොළඹ නාලන්දා විද්‍යාලය, ගෝතමී බාලිකා විද්‍යාලය, කොළඹ සිරිමාවෝ බාලිකා විද්‍යාලය, පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය, සපුගස්කන්ද විශාකා බාලිකා විද්‍යාලය, කිරිබත්ගොඩ විහාරමහාදේවි විද්‍යාලය, මිනුවන්ගොඩ ජනාධිපති විද්‍යාලය, ගාල්ල මහින්ද විද්‍යාලය, කතළුව මධ්‍ය මහා විද්‍යාලය, ගාල්ල සංඝමිත්තා බාලිකා විද්‍යාලය, ගම්පහ රත්නාවලී බාලිකා විද්‍යාලය යන පාසල්වල සිසුසිසුවියන් සම්බන්ධ විය. මෙම කර්තව්‍ය සඳහා නාලන්දා විද්‍යාලයීය පරිශ්‍රය ලබාදුන්, ගරු විදුහල්පති රංජිත් ජයසුන්දර මහතා සහ ඡායාරූප ශිල්පය භාර ආචාරිනී නිර්මලා චාන්දනී මහත්මිය ස්තූතියි පූර්වකව සිහිකරමු.

# ගොඩනැගිලි අරමුදලට අපිත් දායකවෙමු



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ මූලස්ථානය සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳ ඉදිරිපත් වූ යෝජනා මූලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුවේ අවධානයට බඳුන් කරන ලදුව, ඔරොත්තු දෙන ගෙවීම් ක්‍රමවේදයකට අනුව සංගමය වෙත මුදල් ලබා දීමට හැකි වැඩ පිළිවෙළක් යෝජනා කෙරිණි. ඒ අනුව පහත සඳහන් ගෙවීම් ක්‍රම තුනට යටත් ව රු. 12000/= ක මුදලක් සපයා දීමෙන් ඒ සඳහා මේ මොහොතේ අත්‍යවශ්‍ය ම වන ඔබේ දායකත්වය සංගමය වෙත ලබා දෙන ලෙස මහත් කාරුණික ව ඉල්ලා සිටිමු.

මේ සඳහා වන ඔබේ පරිත්‍යාගය, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රධාන ශාඛාවේ 100010100838 අංක දරණ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප සංගමයේ ගොඩනැගිලි අරමුදල් ගිණුමට බැර කළ හැකි ය. නොඑසේ නම් එය ගරු මුදල් අධ්‍යක්ෂතුමිය වෙත මුදලින් ලබා දිය හැකි ය.

## ගෙවීමේ ක්‍රම විධි

**01.** එකවර රු. 12000 ක් මුදල පරිත්‍යාග කිරීම.

**02.** 2016 දෙසැම්බර් 31 දිනට පෙර රු. 6000 ක මුදලක් සහ 2017 දෙසැම්බර් 31 ට පෙර ඉතිරි රු. 6000 ක මුදල පරිත්‍යාග කිරීම.

**03**. මසකට රු. 1000 බැගින් මාස 12 ක කාලයක් අඛණ්ඩව සංගමය වෙත මුදල් පරිත්‍යාග කිරීම.

ඉහත කවර හෝ ක්‍රමයකට අනුව රු.12000 ක මුදල ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ එකී අපරිමිත සහයෝගය හා ආශීර්වාදයට උපහාරයක් ලෙසින්, මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාවක් සහ සහතික පත්‍රයක් ඔබ වෙත ගෞරව බහුමානයෙන් ප්‍රදානය කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ.

මෙලෙස මූලස්ථාන ව්‍යාපෘතියට දායකත්වය එක්කරන්නට සංගමයේ සාමාජික සාමාජිකාවන් රැසක් දැනටමත් ඉදිරිපත් වී සිටිති. සාමාජික ඔබ මෙන් ම සංගමයේ ඉදිරි ගමනට ආශිර්වාද කරන බාහිර පරිත්‍යාගශීලී හිතවතුන් හා පින් කැමති අයගේ දායකත්වය ද මූලස්ථාන ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම පිණිස වන මහත් උපකාරයකි. අප සංගමයේ සාමාජිකයෙකු නොවුවද අපට උදව් කරන්නට කැමති ඔබේ හිතවතුන් ද මේ සඳහා සම්බන්ධ කරදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

### මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාලාභීන්

01. නිරෝෂන් වරුසවිතාන මහතා
02. නිහාල් අබේරත්න මහතා
03. විජය බස්නායක මහතා
04. වින්ද්‍යා බස්නායක මෙනවිය
05. ශ්‍රී ලංකා තෙවන ඇස ඡායාරූප හා මාධ්‍ය ශිල්පී සංගමය, හලාවත

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප සංගමයේ මූලස්ථානය ගොඩනැගීමේ කාර්යය සඳහා පසුගිය දෙමසක කාලය තුළ රුපියල් 12000 ට වැඩි මුදල් ආධාර ලබාදුන් භවතුන්ගේ නම් ඉහත සඳහන් ය. සංගමයේ ගෞරවනීය දායකත්වය සම්බන්ධයෙන් ගෞරවය හා ස්තුතිය පිරිනමමු.


## අපේ මහගෙදර.. අපි ම තනමු..

# මහබෝධියේ අපේ පන්තිය..

දීර්ඝ කාලීන ගැටලුවක් වූ, සංගමය සතු බඩු බාහිරාදීන්ගෙන් ඉරු දින ඡායාරූප පන්තියට අදාළ පුටු, මල්ටිමීඩියා යන්ත්‍ර ආදිය සුරැකිව තබා ගැනීමට ස්ථානයක් නොමැති වීමට යම් සහනයක් ලබා දෙමින්, මහාබෝධි විද්‍යාලයේ සක්‍රීය පන්ති කාමරයක් අප අවශ්‍යතාවන් සඳහා භාවිත කිරීමට විද්‍යාලීය පාලන අධිකාරිය කටයුතු කරන ලදී. ඒ පිළිබඳව මහාබෝධි විද්‍යාලයේ විදුහල්පති උපුල් කාරියවසම් මහතා වෙත සංගමයේ ගෞරවනීය ස්තූතිය පිරිනැමේ.

පසුගිය දෙසැ. 17 වැනි දින ඉරු දින අප සාමාජිකයින් එක්ව එම පන්ති කාමරය පිරිසිදු කර තීන්ත ගා විදුලි පරිපථ සවිකර අලුත්වැඩියා කරන ලදී. මෙහි සම්බන්ධීකරණ කර්තවය ගරු සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂ තුෂාර සමරකෝන් මහතා විසින් සිදු කරන ලදී.





# අපේ විත්ති

## ඡායාරූප දිවියට කළ සේවය ඇගයීම



බස්නාහිර පලාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය සංවිධානය කළ කලා ක්ෂේත්‍රයේ විවිධ අංශ වලින් නිපුණතා දැක්වූ ප්‍රවීණයන් හට උපහාර පිදීමේ රාජ්‍ය උත්සවයක් පසුගිය දෙසැ 27 දින, කොළඹ 07 බස්නාහිර පලාත් සෞන්දර්ය නිකේතනයේ දී පවත්වන්නට යෙදුනි. මෙදින ඡායාරූප ක්ෂේත්‍රයට සිදුකරන ලද සේවාව අගයමින් අප සංගමයේ යාවජීව සාමාජික බන්දු ගුණරත්න මහතා ඇතුලුව ආර්. ජී. නිව්ටන් පෙරේරා මහතා සහ ඒ. සුන්දරරාජන් මහතා බුහුමනට පාත්‍ර විය.




## සුබ මංගලම්

සංගමයේ සාමාජික කුසල් අමරසේකර මහතා පසුගියදා නිපුනි පෙරේරා මෙනවිය සමග යුග දිවියට පා තැබුවාය. නව යුවලට අප සැමදෙනාගේ සුබපැතුම් එක් කරමු.

## Canon PhotoMarathon - SL 2016

පසුගිය නොවැ. 19 වන දින පැවැත්වූ Canon PhotoMarathon - SL 2016 ඡායාරූප තරගයේ පළමු ත්‍යාගය හිමිකර ගැනීමට අප සංගමයේ සාමාජිකා තුෂාරා සෙව්වන්දි අබේරත්න මිය සමත් විය.



## මොහාන්ට FIAP රන් සම්මානයක්

හංගේරියාවේ පැවැති 05 වන Perlensis Photo Salon ජාත්‍යන්තර ඡායාරූප තරගයේ දී ඒක වර්ණ අංශයේ රන් සම්මානය දිනාගැනීමට අප සංගමයේ සාමාජික මොහාන් ගුරුසිංහ මහතා ගේ "Smiling Kids" ඡායාරූපය සමත් විය.



## නිරෝගී සුව පතමු

• හදිසියේම බරපතල ලෙස රෝගාතුර වූ අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික සුනේත්‍රා ච්‍යුකාන්ති මහත්මියට ඉක්මන් සුව ප්‍රාර්ථනා කරමු.

• හදිසියේ අනතුරකට ලක්ව ප්‍රතිකාර ලබමින් සිටින ජ්‍යෙෂ්ඨ සාමාජික අශෝක ප්‍රේමසිරි මහතාට ඉක්මන් සුව පතමු.



## සමන්ගෙන් දැයට පිපුණු මල්

සංගමයේ සාමාජික මාධ්‍යවේදී කේ. වී. සමන් විජය බණ්ඩාර මහතා රචිත ස්වර්ණ බිම්බ දැයට පිපුණු මල් 09 උපහාර ග්‍රන්ථය පිළිගැන්වීම පසුගිය දෙසැ. 24 වැනි දින හෝමාගම පුරාණ විහාරයේ දී පැවැත්විණි.

ඔබේ තොරතුරුත් අපේ විත්තියට කියන්න - 0716 450 871/ kmanujith@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
The National Photographic Art Society of Sri Lanka

# නිලධාරී මණ්ඩල වගකීම්

## අරමුණු

සාමාජිකත්වයේ බහුතර එකඟතාව පරිදි පත්කරගනු ලබන නිල වගකීම් හොබවන අයගෙන් සංගමයේ අභිවෘද්ධිය සඳහා වඩාත් වැඩි දායකත්වයක් ලබාගැනීම මෙයින් අරමුණු කෙරේ.

## නිර්දේශ

**01. පොදු කොන්දේසි**

**1.1.** අධ්‍යක්ෂ මණ්ඩලය මෙන් ම ඒ යටතේ පවතින අනු කමිටු ද විශේෂ කමිටු සහ මණ්ඩලවල වගකීම් හොබවන අය ද නිලධාරීන් ලෙස සැලකේ.

**1.2.** තමන් විසින් භාරගන්නා වගකීම්, සංගමයේ ව්‍යවස්ථාව සහ චක්‍රලේඛ මගින් අර්ථ නිරූපණය කොට ඇති පරිදි ඉටුකරලීමට නිලධාරීහු බැඳී සිටිති.

**02. අධ්‍යක්ෂ මණ්ඩලය**

**2.1.** වාර්ෂික මහා සභාවේ දී සාමාජිකයින්ගේ තෝරාගැනීම මත වසරක නිල කාලසීමාවක් සඳහා පත්කරගනු ලැබේ.

**2.2.** අධ්‍යක්ෂ මණ්ඩල ව්‍යුහය ව්‍යවස්ථාවෙන් දක්වා ඇති පරිදි වේ.

**2.3.** එක් අධ්‍යක්ෂවරයෙකුට එක දිගට එක් තනතුරක රැඳී සිටිය හැකි උපරිම කාලය වසර 03 කි. එහෙත්, මහා සභා රැස්වීමක ඒකමතික තීරණය සහ අදාළ අධ්‍යක්ෂවරයාගේ කැමැත්ත පරිදි වැඩිපුර එක් වසරක් එකී තනතුරෙහි රැඳී සිටිය හැකි ය.

**2.4.** අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වශයෙන් එකී එක් තනතුරක අඛණ්ඩ ව රැඳිය හැක්කේ වසර 03 ක් වුව ද, තනතුරු වෙනස් වන්නේ නම් අධ්‍යක්ෂ මණ්ඩලය තුළ තවත් වසර 03 ක් බැගින් අභිමත කාලයක් රැඳී සිටිය හැකි ය.

**2.5.** කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකුට එරෙහිව සාමාජිකත්වය වෙතින් හෝ වෙනත් බාහිර පාර්ශවයකින් කිසියම් විරෝධයක් ගොඩනැගෙන්නේ නම් එය, ලිඛිතව අධ්‍යක්ෂ මණ්ඩලය හමුවේ සභාගත කොට විවෘත තීන්දුවක් ගත හැකි ය. එය අදාළ චූදිතයා රහිත ව අධ්‍යක්ෂ මණ්ඩලයේ සෙසු සාමාජිකයින්ගේ ඒකමතික එකඟතාව මත ගනු ලබන තීරණයක් හෝ ඊට අදාළව පත්කරනු ලැබූ විශේෂ කමිටුවක වාර්තාවක් සලකා බලා ගනු ලබන තීරණයක් විය යුතු ය. එවන් අවස්ථාවක චූදිතයා සතු නිල වගකීම් සභාපතිවරයා වෙත හෝ විධායක අධ්‍යක්ෂවරයා වෙත පවරාගත හැකි ය.

**2.6.** සෑම අධ්‍යක්ෂවරයෙකුට ම තම තනතුරෙහි වගකීම සාර්ථක ලෙස ඉටුකරලීම වෙනුවෙන් අනුකමිටු සහ උපකමිටු එකක් හෝ කිහිපයක් පත් කරගත හැකි අතර, ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකමතික අනුමැතිය අවශ්‍ය වේ.

**2.7.** සංගමයේ ලිපි ශීර්ෂවල තම අත්සනින් යුතුව ලිපි නිකුත් කිරීමේ බලය ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට පමණි. එහෙත් අත්‍යවශ්‍ය අවස්ථාවන්හි අධ්‍යක්ෂවරුන්ගේ වගකීම හා අවසරය යටතේ අන් සාමාජිකයෙකුට ලිපි ශීර්ෂයක අත්සන් කළ හැකි ය.
එලෙස නිකුත් කෙරෙන සියලු ම ලිපිවල පිටපත් දෙසතියක් ඇතුළත විධායක අධ්‍යක්ෂවරයා වෙත භාරදිය යුතු ය.

**2.8.** තමන් යටතේ පවතින අනුකමිටු, උපකමිටු හෝ විශේෂ කමිටුවල ක්‍රියාකාරීත්වය පිළිබඳ සම්පූර්ණ වගකීම අදාළ අධ්‍යක්ෂවරයාට පැවරේ.

**03. අනුකමිටු සහ උපකමිටු**

මේ සඳහා ව්‍යවස්ථික ප්‍රතිපාදන වගන්ති 04 ක් යටතේ මෙහි ඇතුළත් වේ.

**04. විශේෂ කමිටු**

වගන්ති 02 ක් යටතේ විශේෂ කමිටු පිළිබඳව ප්‍රතිපාදන ඇතුළත් වේ.

**05. සභාපතිවරයා සතු වගකීම් සහ බලතල**

වගන්ති 02 ක් යටතේ සභාපතිවරයාගේ වගකීම් හා බලතල මෙහි සඳහන් ය.

**06. අධ්‍යක්ෂවරු සතු වගකීම් සහ බලතල**

ව්‍යවස්ථාවේ 13.3 වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල අරුත්ගන්වා ඇති අතර ඊට අනුගතව සභාපතිවරයාට සහාය වෙමින් සංගමයේ ඉදිරි ගමන සඳහා ඇපකැප වී කටයුතු කිරීම අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

**07. නිලධාරීන් සතු වරප්‍රසාද සහ ප්‍රතිලාභ**

**5.1.** අධ්‍යක්ෂ මණ්ඩල හා කමිටු සාමාජික තනතුරු හොබවන සෑම කෙනෙක් ම වැටුප් හෝ දීමනා නොලබන ගරු සේවයක නියැලෙන්නෝ වෙති. ඊට අදාළ ප්‍රණාමය සෑම විට ම ඔවුනට හිමි විය යුතු වේ.

**5.2.** ඡායාරූප ක්ෂේත්‍රයට අදාළව කරනු ලැබූ සේවාව ඇගැයීමට ලක්කොට පිරිනමනු ලබන සම්මාන සඳහා, නිලධාරීන් ලෙස සංගමයට සේවය කර තිබීම විශේෂයෙන් සලකා බැලිය යුතු කරුණකි.

## සමාජ සේවා පුවත්

# වාර්ෂික සමාජ සත්කාරය

### මඩකලපුව, සින්නවත්තට








සංගමයේ වාර්ෂික සමාජ සත්කාරක වැඩ සටහන නොවැම්බර් මස 13 දින මඩකලපුව, සින්නවත්ත පන්ථාරාම විහාරස්ථානයේදි පැවැත්විනි. මෙහිදි සින්නවත්ත මෙත්සිරි දහම් පාසැල් සිසුන් 45 දෙනෙකු වෙත පොත්පත් හා පාසැල් උපකරණ පිරිනැමීමද පුස්තකාලය සඳහා පොත් පිරිනැමීම හා විහාරස්ථානය සඳහා මුදල් පරිත්‍යාගයක්ද සිදුවිය.

සංගමයේ ජේෂ්ඨ සාමාජික, සාමාජිකාවන් පිරිසක් මෙම වැඩ සටහන සඳහා සහභාගී වු අතර ශ්‍යාමලී කරුණාපාල හා නන්දනි හෙට්ටිඅච්චි යන සමාජ සේවා කමිටු සාමාජිකාවන් විසින් මෙම කටයුතු සංවිධානය කරන ලදි. වැඩ සටහන සාර්ථක කර ගැනීම සඳහා දායකත්වය ලබා දුන් ජ්‍යේෂ්ඨ සාමාජික, සාමාජිකාවන්ටත්, ඡායාරූප පන්ති වල සිසුන්ටත් සමාජ සේවා හා සුභ සාධක අධ්‍යක්‍ෂතුමන් සිය ස්තූතිය පල කර සිටි.





## විල්සන් හෑගොඩ 102 වන ජන්ම සංවත්සර පිංකම

අප මහ ඇදුරු හෑගොඩ සූරීන්ගේ 102 වන ජන්ම සංවත්සර නිමිත්තෙන් ජනවාරි මස 08 වන ඉරුදින පස්වරු 07 ට. රාජගිරිය, මාදින්නාගොඩ ශ්‍රී සුරම්‍යාරාම පුරාණ විහාරස්ථානයේ දී,

ගංගොඩවිල පඤ්ඤෝදයාරාමය හා ගාල්ල උණවටුන පීල්ලගොඩ පුරාණ විහාරය යන උභය විහාරාධිපති කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ පශ්චාත් ආයතනයේ, කතිකාචාර්ය පූජ්‍ය මඬිහේ සුගතසිරි නාහිමිපාණන් විසින් මෙහෙයවන ධර්ම දේශනාවක් පැවැත්වේ.

මෙහි සම්බන්ධීකරණය අප ජ්‍යේෂ්ඨ සාමාජිකා අමරා වීරසේකර මහත්මිය විසින් සිදු කරන අතර අප සාමාජික භවතුන්ගේ පැමිණීම ඉතාමත් ගෞරව පූර්වකව අපේක්ෂා කරමු.

## අපගේ ශෝකය

- පසුගිය ජූනි මස අප අතරින් සමුගත් ජ්‍යෂ්ඨ සාමාජික ධර්මසේන නවගමුව මහතාගේ අභාවය දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුවය.
- පසුගිය අගෝස්තු මස අප අතරින් සමුගත් ජ්‍යෂ්ඨ සාමාජික ජේ. පී. ප්‍රේමසිරි මහතාගේ අභාවය දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුවය.
- හිටපු ප්‍රකාශන අධ්‍යක්ෂවරයෙකු වන ශමල් පෙරේරා මහතාගේ දයාබර මාමණ්ඩියගේ අභාවය ද
- අප සංගමයේ යාවජීව සාමාජික අජිත් චිල් සිරිවර්ධන මහතාගේ දයාබර පියාගේ අභාවය ද
- අප සංගමයේ ජ්‍යෂ්ඨ සාමාජිකා ලක්ෂ්මි තිලකරත්නයන්ගේ දයාබර කණිටු සොයුරියගේ අභාවය ද
- ජ්‍යෂ්ඨ ඡායාරූප කලාවේදියෙකු වූ ඩන්ස්ටන් වික්‍රමරත්න මහතාගේ අභාවය ද

දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුවය.

# ජයග්‍රහණ

**මාසික තරග ජයග්‍රහණ (මීගමු වෙරළ වැඩමුළුව - 2016 නොවැම්බර් 06)**



■ **ඒක වර්ණ**

01. මොහාන් ගුරුසිංහ
02. චිරන්ත සංජීව
03. මොහාන් ගුරුසිංහ
04. කසුන් රණමුක
05. ගගන් කරුණාචන්ද්‍ර

ඒක වර්ණ ප්‍රථම ස්ථානය - වෛද්‍ය එම් එස් වීරකෝන් ශූරතාව
මොහාන් ගුරුසිංහ



■ **වර්ණ**

01. දනූෂ නදීන්
02. ගිහාන් රංගන
03. චිරන්ත සංජීව
04. කසුන් රණමුක
05. මිරෝශන් වික්‍රමාරච්චි

වර්ණ ප්‍රථම ස්ථානය
දනූෂ නදීන්

*ඡායාරූප තේරීම් කමිටුව - ප්‍රියන්ත අමරසිංහ මහතා | ප්‍රියන්ත අබේසුන්දර මහතා | ඉඳුනිල් මුණසිංහ මහතා*

*මාසික තරග සංවිධායක කමිටුව*
*මධුරංග අබේවර්ධන (0773 549 449)*
*සමන්ත ධර්මවර්ධන | ඉසුරු රාජපක්ෂ*

# ප්‍රදර්ශන පුවත්

**NPAS 2016/01 අනුග්‍රාහකත්වය යටතේ**
**ශ්‍රී ලංකා තෙවන ඇස ඡායාරූප හා මාධ්‍ය ශිල්පීන්ගේ සංගමයේ**
***05 වැනි ඡායාරූප කලා මංගල්‍යය***



ශ්‍රී ලංකා තෙවන ඇස ඡායාරූප හා මාධ්‍ය ශිල්පීන්ගේ සංගමයේ 05 වැනි ඡායාරූප ප්‍රදර්ශනය පසුගිය නොවැම්බර් 28, 29, 30 දිනවල මීගමුව නගර සභා ශාලාවේ දී පැවැත්විණි.


ප්‍රදර්ශන හා තරග සම්බන්ධයෙන් වන නිල ශ්‍රී ලංකික ප්‍රමිතිය පරිදි ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ NPAS 2016 / 01 අනුග්‍රාහකත්වය යටතේ සංවිධානය කෙරුනු මෙම ප්‍රදර්ශනයේ තරග අංශ 06 කින් සමන්විත විය. විවෘත වර්ණ, විවෘත කළුසුදු, වනජීවී හා පරිසර, සරණ මංගල්‍ය, සාමාජික, පාසල් ශිෂ්‍ය වශයෙන් වෙන්කොට තිබූ මෙම අංශ වල ජයග්‍රාහකයන්ට ත්‍යාග, සම්මාන හා තිළිණ ප්‍රදානය 28 වැනි දින පෙරවරු පැවති සමාරම්භක උළෙලේ දී කැපිටල් මහරාජා ව්‍යාපාරයේ සමූහ අධ්‍යක්ෂ ෂෙවාන් ඩැනියෙල් මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

# ප්‍රකාශන පුවත්

## ඔබේ තොරතුරුත් පිළිසඳරට ලියන්න

ඔබේ ඡායාරූප දිවියේ ජයග්‍රහණ, වැදගත් කඩඉම්, සංගමයේ සාමාජිකයින් සමග බෙදාගන්නට. ඔබේ තොරතුරුත් පිළිසඳරට යොමුකරන්න.


**ගරු. ප්‍රකාශන අධ්‍යක්ෂ,**
**ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය,**
**නො. 170, කොළොන්නාව පාර, දෙමටගොඩ, කොළඹ 09.**
Email: npassrilanka@gmail.com / kmanujith@gmail.com

## ආවර්ජනා

අහස් කුස දැල්වී දිලෙන තරු රෑන
කවුළුවෙන් එබී බලා සිනාසී යයි රෑට
දෑස් ඇරයුම් කරන් බලා සිටියත් අඹර
මගේ කුටියේ අඳුර දුරලන දිනය දුර ඈත

සඳහිමින් ළඟ නොමැති තනි යහනෙ ශීත රැය
පාළු තනිකම ඇකයෙ අඳුර හා ගුලිව ඇත
තරු එළිය හොර රහසේ සැඟව යන අඹර දෙස
සීත ගුලි බිඳු රැඳුනු නෙතු අයා සිටිමි මම

කඳු ශිඛර තුරු මතින් තරු දිලෙයි දුර ඈත
රැයෙහි දිගු බව දැනේ නිදි නොමැති කුටිය තුළ
හීන පාමුලේ දිළෙන පහන්තරු පාය නැත
සිතේ තෙරපෙන පැතුම් නුඹ ගැබට දැනී නැත

ලාල් වික්‍රමතන්ත්‍රී

## 2016 සහයෝගයට ස්තූතියි..

2016 වසර තුළ අප සංගමය මගින් දියත් කළ ව්‍යාපෘති ගොන්නට අතහිත දුන් අනුග්‍රාහක හවතුන්ට අපගේ ප්‍රණාමය පුද කර සිටිමු.

JAMPHOTO EVERLASTING BEAUTIFUL STORIES | CLAN A LIFE with a CAMERA | A Pictures The Photo Shop | Leaf | Canon | DN | MATRO ELECTRONIC EQUIPMENTS | CameraLK | metropolitan | Nikon Photo TECHNICA | seyacolor shades of paradise | eneloop | Lakseya DIGITAL COLOUR LAB (PVT) LTD


පිළිසඳරට වෙහෙස මහන්සිය
ප්‍රකාශන අධ්‍යක්ෂ - මනුජිත් කටුගම්පොල

පිළිසඳර *ප්‍රකාශන අනුකමිටුව*

1 වසර: මධුෂිකා ලක්මාලි/දිනෙත් ප්‍රනාන්දු
චමින්ද වීරසිංහ/ ගිහාන් දූල්වල
2 වසර: ආර්. එම්. මඩවල/මදුෂිකා ලක්මාලි/
පියෝරි නිරන්ජන්
3 වසර: චින්තක දන්තනාරායන